# ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය
# ஸ்ரீ லங்கா நிருவாக சேவைச் சங்கம்
# SRI LANKA ADMINISTRATIVE SERVICE ASSOCIATION


මගේ අංකය / எனது இல. / My Ref.

ඔබේ අංකය / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.03.02

**සියලු පුරවැසියන්ගේ දැන ගැනීම පිණිස,**

<u>ශ්‍රී ලංකා මහ බැංකු සේවකයින්ගේ වැටුප් වැඩි කිරීම</u>

ජයන්ත කෝවිල් ගොඩගේ මහතා විසින් ඔහුගේ යූ ටියුබ් නාලිකාවේ ප්‍රචාරය කරන ලද, ඔහු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා සමග සිදු කළ සංවාදයේදී අවධානයට ලක් නොවූ කරුණු කිහිපයක් ගෞරවයෙන් යුතුව මතු කිරීමට කැමැත්තෙමු.

මහ බැංකු නිලධාරීන්ට ආර්ථික විද්‍යාවට පමණක් සීමා නොවූ වඩා පුළුල් අවබෝධයක් තිබිය යුතුය. ඔවුන්ගේ අධ්‍යාපනයට, සමාජ විද්‍යාව, සාමය සහ ගැටුම් අධ්‍යයනය වැනි සමාජ විද්‍යාවන් ඇතුළත්විය යුතු අතර ඔවුන් මානව හැසිරීම් වඩාත් හොඳින් අධ්‍යනය කර ගනිමින් තම තීරණවල සමාජීය බලපෑම ග්‍රහණය කර ගැනීමේ හැකියාවක් ඇති අය විය යුතුය.

මෙම පුළුල් අවබෝධය නොමැති වත්මන් තීරණ ගැනීමේ ක්‍රියාවලිය හේතුවෙන් සමාජ නොසන්සුන්තාවක් හට ගැනීමේ අවදානමක් ඇත. මෑත වැටුප් හා දීමනා වැඩි කර ගැනීමේ සිදුවීම මේ සඳහා හොඳම උදාහරණයකි.

ප්‍රතිපත්ති සම්පාදනයෙන් සහාය දැක්විය යුතු ආයතනයක් වන ශ්‍රී ලංකා මහ බැංකුව, අනෙකුත් සමාජ සංවර්ධන දර්ශකවලට බලපෑම් කරමින් වත්මන් ආර්ථික තත්ත්වයට අවාසනාවන්ත ලෙස පහළ දැමීමට දායක වූ බවට ද කතිකාවතක් පවතී.

තමන්ගේම පරිසරය තුළට සීමා වී සිටින මහ බැංකු වෘත්තිකයන් මානව සාධකය නොසලකා හරිමින් දත්ත මත පමණක් විශ්වාසය තබා කටයුතු කරනු නිරීක්ෂණය වේ. මෙම ප්‍රවේශය අනෙකුත් රාජ්‍ය සේවාවන් පුරවැසියන් සමඟ සෘජුව අන්තර් ක්‍රියා කිරීම සහ ප්‍රතිපත්ති තීරණවල සැබෑ ප්‍රතිවිපාක අත්විඳීමට වඩා හාත්පසින් ම වෙනස් වූ තත්ත්වයකි.

මෙහිදී ඓතිහාසික සන්දර්භය ද සලකා බැලීම වැදගත් වේ. 1978 දී, මහ බැංකුවේ සහ රාජ්‍යය සතු ව්‍යවසාය (SOEs) හි සමාන ශ්‍රේණිගත නිලධාරීන්ගේ වැටුප් බොහෝ දුරට සමාන මට්ටමක විය. කෙසේ වෙතත්, පසුව භාණ්ඩාගාර ලේකම් බවට පත් වූ හිටපු මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති වරයෙකු විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිමය වෙනසක්, සාමූහික කේවල් කිරීම හරහා සෑම වසර තුනකට වරක් රාජ්‍යය සතු ව්‍යවසායන්හි වැටුප් නැවත සංශෝධනය කිරීමට ඉඩ ලබා දුන්නේය.


23 සී, සමුළු නිවාස, කැප්පෙටිපොල මාවත, කොළඹ 05, 23 சீ, சமித் தொடர்மாடி, கெப்பெட்டிபொல மாவத்தை, கொழும்பு 05, 23 C, Summit Flats, Keppetipola Mw., Colombo 05.

දුරකථනය / தொலைபேசி / Telephone: 011 5766855 | ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No.: 011 2058027 | විද්‍යුත් තැපැල් / மின்னஞ்சல் / E - mail: sasaexco31@gmail.com, inbox@sasa.lk | වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.sasa.lk

මෙම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා මහ බැංකුවට තමන්ගේම වැටුප් වැඩිකර ගැනීමට මග පෑදූ අතර, ඒ හරහා කලින් මහා භාණ්ඩාගාරයට ලැබුණු රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් බදු නොවන ආදායම මහා භාණ්ඩාගාරයට ලැබීම අඩු විය.

භාණ්ඩාගාර ලේකම් ලෙස කටයුතු කළ තවත් හිටපු මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති වරයෙකු වැටුප් වැඩි කිරීමට වඩා අනවශ්‍ය ප්‍රමාණයක් රාජ්‍ය සේවයට බඳවා ගැනීමට ප්‍රමුඛත්වය දුන්නේය. පොත් ගණන් තැබීමෙන් පමණක් සමාජ ගැටලු කළමනාකරණය කළ හැකි බවට වූ ඔහුගේ විශ්වාසය අදූරදර්ශී බව ඔප්පු විය. ජාතියට තවත් බර පටවමින් ඔහුට විශ්‍රාම වැටුප් දෙකක් ද ලැබිණි.

වෙළඳපල සහ සමාජ තත්වයන් සංකීර්ණ ලෙස බැඳී ඇත. සියලුම පුරවැසියන් මෙන් ම,මහ බැංකුවේ සේවකයින් ද මෙරට පාරිභෝගිකයන් වන අතර, මහජන බදු මගින් අරමුදල් සපයන සම්පත් සහ යටිතල පහසුකම් ඔවුන් ද භුක්ති විඳියි. එබැවින්, මහ බැංකුවේ තීරණවලදී වෙළඳපල මිල ගණන් පමණක් නොව, පුළුල් සමාජ හා සදාචාරාත්මක ඇඟවුම් ද සලකා බලන ලෙස අපි ඉල්ලා සිටිමු.

ප්‍රජානන/ස්නායු විද්‍යාව පවසන්නේ විධායක කාර්යයන් සඳහා වගකිව යුතු මොළයේ පූර්ව ඉදිරිපස බාහිකය, තීරණ ගැනීමේ සහ සදාචාරය හැඩගැස්වීමේ කාර්යභාරයක් ද ඉටු කරන බවයි; මීට අමතරව, මුල් ළමාවියේ අත්දැකීම් සදාචාර වර්ධනයට සැලකිය යුතු ලෙස බලපාන බවයි.

මෙම සාධක නොසලකා හැරීමෙන්, අතෘප්තිමත් පුරවැසියන්ගෙන් යුත් ජාතියක් නිර්මාණය වන අතර එවැනි අතෘප්තිකර තත්ත්වයන් වලින් පීඩා විඳින දෙමව්පියන් බිහිකරන දරුවන්ගේ මොළයේ පූර්ව ඉදිරි බාහිකය නිසි ලෙස සංවර්ධනය නොවීම තුළ ඇතිකරවන සදාචාරාත්මක බව සහකම්පනය ආදී ගුණවලට බලපෑම් ඇතිකරවන හෙයින් මෙම තීරණවල පිරිවැය දරන්නට වන්නේ අනාගත පරම්පරාවලටය.

මෙම කරුණු සළකා බලා ආර්ථිකයේ සහ සමස්ත සමාජයේ යහපැවැත්ම සහතික කරමින් තීරණ ගැනීම සඳහා වඩාත් පරිපූර්ණ ප්‍රවේශයක් අනුගමනය කිරීමට ප්‍රතිපත්ති සම්පාදනය වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ විධායක කමිටුවේ විධානය පරිදි,

එම්.එල්. ගම්මන්පිල
ගරු සභාපති

කාලින්ද්‍ර ජයවීර ප්‍රනාන්දු
ගරු ලේකම්